# බෞද්ධ ජන සමාජය හා බැඳුණු මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි සහ විශ්වාස

ලක්ෂාන් රොහන්ත තාඹුගල[1]
ජේ. තේජනී කසුන්කා ජයවර්ධන[2]

බුදුරජාණන් වහන්සේ ශ්‍රී සද්ධර්මය ලොවට දේශනා කිරීමටත් පෙර සිට මිනිසුන් තුළ විවිධ ඇදහිලි සහ විශ්වාස තිබී ඇත. එනම් ගස්, ගල්, ඉර, හඳ වැනි අජීවී වස්තූන් පූජනීයත්වයෙන් සලකා මිනිසුන් පුද පූජා පවත්වා ඇත. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී දෙසූ ධර්මයත් සමඟින් මිනිසුන්ගේ ඇදහිලි, විශ්වාසයන්ගේ වෙනසක් ඇති විය. එනම් බෞද්ධ ජන සමාජයක් ඇති වීම මෙහිදී සුවිශේෂී වේ.

නමුත් දස සංයෝජනයන්ගෙන් බැඳී සිටින පුද්ගල මනස සංකීර්ණත්වයට පත් ව ඇත. සත්ත්වයා නිතරම භෞතික ලෝකයේ ගැටෙමින්, භෞතික වස්තූන්ට ඇලුම් කරමින් ජීවිතය ඉතාමත් සුඛවත් ලෙස ගත කිරීමට උත්සහ කරයි. මෙලෙසින් පුද්ගලයා තුළ මානසික අසමතුලිත බව ඇති කරන ප්‍රධානතම ආස්‍රවයක් වන්නේ තෘෂ්ණාවයි. මෙම තෘෂ්ණාව කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ලෙස තෙවදෑරුම් බව දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ විස්තර කර ඇත.

මෙලෙසින් තම ලෝකෝත්තර සැපත පසෙකලා ලෞකික සැපත සොයන්නා වූ පුද්ගලයා හොඳ නරක, යුතු අයුතුකම් පසෙකලා තම කටයුතු කෙලෙසින් හෝ අනෙකා පරයා කිරීමට උත්සහ ගනිති. මෙහිදී මිනිසා නොදැනුවත්ව ම සංකීර්ණ සමාජය තුළ අතරමං වෙමින් මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි සහ විශ්වාස වෙත යොමු වී ඇත. මෙම මිත්‍යා දෘෂ්ටික ඇදහිලි සහ විශ්වාසයන් තුළින් සමාජය වෙත සිදු වන්නා වූ අභාග්‍ය අතිමහත් ය. මෙයින් මතු පරම්පරාව ද බේරා ගනු වස් සමාජය තුළ මේ පිළිබඳ කතිකාවතක් ඇති විය යුතු කාලය එළඹ ඇත.

අධ්‍යයනයේ අරමුණ මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි සහ විශ්වාසයන් හඳුනා ගැනීම

මිනිසා මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි සහ විශ්වාසයන්ට යොමු වීමට හේතුව විමසා බැලීම

දත්ත රැස් කිරීමේ උපකරණ ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා

**ක්‍රමවේදය**

පොල්ගහවෙල ප්‍රදේශීය කොට්ඨාසයෙන් අහඹු ලෙස තෝරා ගත් පවුල් දහයක් (10) නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. මෙම පවුල් ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයන් යටතේ පරීක්ෂණයට භාජනය විය.

**නිගමනය**

බෞද්ධ ජන සමාජයක් වුව ද මිනිසා තුළ වැඩි විශ්වාසයක්, වැඩි නැඹුරුතාවයක් පවතිනුයේ මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි සහ විශ්වාසයන් කෙරෙහි ය යන්න මෙහිදී ගම්‍ය විය. එමෙන් ම මිනිසා භෞතික ලෝකයේ වෙසෙමින් සුඛය සොයා යෑම නවත්වා

1 කනිෂ්ඨ විධායක නිළධාරී, සෞඛ්‍ය සේවා, ක්ෂක නිවස, කොළඹ 02
lakshanoppo@gmail.com
2 සහකාර කථිකාචාර්ය, මනෝවිද්‍යාව, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
thejanik21@gmail.com

ගැනීමේ සත්‍ය මාර්ගය නොදැනීම සහ ප්‍රඥාවේ ස්වභාවය අනුව ද මිනිසා මිථ්‍යා දෘෂ්ටික ඇදහිලි සහ විශ්වාසයන්ට යොමු වීමට හේතු වශයෙන් හඳුනා ගතහැකි බව මෙහිදී ගම්‍ය විය.

**ප්‍රමුඛ පද :** මිථ්‍යා දෘෂ්ටික, ඇදහිලි, විශ්වාස, භෞතික ලෝකය